පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ NCP/2008/01 (i)

මගේ අංකය:- NCP/CS/PT/4/10(2008)
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
දිනය :2008.01.18

සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## වියදම් සඳහා බලාධිකාරයක් පැවරීම - 2008

ඉහත කරුණ සම්බන්ධව නිකුත් කරන ලද අංක NCP/CS/PT/4/10(2007) හා 2008.01.02 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක : NCP/2008/01 හි විධිවිධාන වලට වැඩිමනත්වයි.

**02. වියදම් කළමනාකරණය**

2.1 2008 මුදල් වර්ෂය සඳහා අනුමත මුදල් ප්‍රකාශයෙන් සළසා ඇති පුනරාවර්තන ප්‍රතිපාදන වලින් වැටුප් හා වේතන, වැටුප් ප්‍රතිපූරණ සහ විශ්‍රාම වැටුප් සහනාධාර සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන හැර අනෙකුත් ප්‍රතිපාදන වලින් 1.5% ක්ද, මූලධන ප්‍රතිපාදන වලින් 7% ක්ද, රජයේ වියදම් සකසුරුවම් ලෙස කළමනාකරණය කිරීමේ අපේක්ෂාවෙන් අවුරා තැබීමට රජය තීරණය කර ඇත. ඒ අනුව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් 2008 වර්ෂයේ පරිපාලන සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීමේදී ඉහත අඩුකිරීම් වලට යටත්ව ප්‍රතිපාදන සීමාවන් සැලකිල්ලට ගත යුතු අතර, එම අඩුකිරීම් වලට යටත්ව වියදම් දැරීම කළ යුතුය.

2.2 ඉහත අඩුකිරීම් වලට යටත්ව තිබෙන ප්‍රතිපාදන යටතේ වැඩ සැලසුම් කිරීමේදී 2007 වර්ෂයෙන් අවිච්ඡේද වූ ව්‍යාපෘති නිම කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු අතර, ප්‍රමුඛ නොවන මූලධන වැඩසටහන් කල්දැමීම, නාස්තිය හා දූෂණය අවම කර ගැනීම සහ අරපිරිමැස්මෙන් වියදම් දැරීම කළ යුතුය.

2.3 කිසියම් හේතුවක් නිසාවත් ඉහත අවුරු තැබීම කරන ලද වැය විෂයන් සඳහා අතිරේක ප්‍රතිපාදන ලබාදීම හෝ මු.රේ.66 යටතේ ප්‍රතිපාදන මාරුවීම් හෝ ලබාදීමට කටයුතු කරනු නොලැබේ. ප්‍රතිපාදන මාරු කිරීම් සම්බන්ධව මාගේ අංක NCP/CS/PT/4/B/1/11(2008) හා 2008.01.16 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2008/04 හි 03 සහ 04 ඡේදවල විධිවිධාන කෙරෙහිද ඔබගේ

අවධානය යොමු කරවමි. එබැවින් එම වැය විෂයයන් යටතේ පවතින ප්‍රතිපාදන මත වියදම් කළමනාකරණය කරගැනීමට අවශ්‍ය සියලුම පියවර ගත යුතුය.

**03. අත්තිකාරම් ගිණුම්**

පලාත් සභාව විසින් අනුමත කර ඇති විසර්ජන ප්‍රඥප්තියේ සහ මුදල් ප්‍රකාශයේ II වැනි කොටසේ දක්වා ඇති අත්තිකාරම් ගිණුම් වල උපරිම වියදම් සීමාව තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු කළමනාකරණය කරගත යුතුය.

3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය.

1. අනුමත උපරිම වියදම් සීමාව තුළ පහත සඳහන් ප්‍රමුඛතාවයන්ට අනුව කටයුතු කළ යුතුය.
   - I. උත්සව අත්තිකාරම්
   - II. විශේෂ අත්තිකාරම්
   - III. ආපදා ණය
   - IV. පාපැදි ණය

2. ආපදා ණය ගෙවීමේදී ඉල්ලනු ලබන සියලුම ණය ගෙවීමට ප්‍රමාණවත් වියදම් සීමාවන් නොමැති බැවින් පහත සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය.
   - I. පළමු වතාවට ආපදා ණය ඉල්ලුම් කරන මාණ්ඩලික නොවන කනිෂ්ඨ ශ්‍රේණිවල සේවකයින් සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.
   - II. පොරොත්තු ලේඛනයක් නඩත්තු කරමින් එම පොරොත්තු ලේඛනයේ අනුපිළිවෙල අනුව ගෙවීම් කළ යුතුය.

04. ඉහත විධිවිධාන වලට අමතරව මවිසින් වියදම් කළමනාකරණය, ප්‍රතිපාදන සැළසීම් සහ අග්‍රිම ලබාදීම් සම්බන්ධව මේ වන විටත් ලබා දී ඇති සහ මතුවට ලබාදිය හැකි උපදෙස් හා විධිවිධාන වලට අනුව මනා කළමනාකරණයකින් යුක්තව අරපිරිමැස්මෙන් සහ නාස්තිය හා දූෂණය අවම වන පරිදි 2008 වර්ෂයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම ගණන් දීමේ නිලධාරීන්ගේ සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමක් වන අතර, ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

ඒ.තලාකොටුනගේ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පලාත.

පිටපත:- විගණකාධිපති - දැ.පි